www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා හමුදාව මහජනතාවට එරෙහි තවත් සාහසික ක්‍රියාවක් ක්‍රියාත්මක කරයි

**Sri Lankan military carries out another atrocity against civilians**

**සරත් කුමාර විසිනි**
**2007 ජනවාරි 5**

දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහිව යුද්ධය තීව්‍ර කරමින් ශ්‍රී ලංකා ආන්ඩුවේ හමුදාව නව වසර තවත් සාහසිකත්වයකින් ආරම්භ කර ඇත.

අඟහරුවාදා වයඹ මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉලුපායිකඩවායි අසල පිහිටි පදහුතුරයි හි දෙමල අනාථ කඳවුරකට ගුවන් හමුදාව බෝම්බ හෙලීය. එල්ටීටීඊයේ ප්‍රකාශකයකුට අනුව පිරිමින්, ගැහුනුන් සහ ලමයින් ඇතුලු සිවිල් වැසියන් 14ක් ගුවන් ප්‍රහාර මගින් ඝාතනය කෙරුනු අතර තවත් තුවාලකරුවන් 35 ක් මන්නාරම සහ කිලිනොච්චියේ රෝහල් වෙත ගෙන යන ලදී. ලැගුම් ගෙන සිටි ස්ථාන ගනනාවක් විනාශ විය, නැතහොත් අලාභහානිවලට ගොදුරු විය.

හමුදාව, ක්ෂනිකව, තමන් සිවිල් ජනයා මත බෝම්බ හෙලූ බව ප්‍රතික්ෂේප කලහ.

ගුවන් හමුදා ප්‍රකාශක, කන්ඩායම් කපිතාන් අජන්තා සිල්වා පුවත් පත් සාකච්චාවකදී පැවසුවේ නැගෙනහිර මන්නාරමේ සහ වාකරෙයිහි හඳුනාගත් එල්ටීටීඊ ඉලක්ක දෙකකට ප්‍රහාර එල්ල කරන ලද බව ය. පසුව, මන්නාරමේ ඉලක්කය, එල්ටීටීඊ කඳවුරක් බව සනාථ කිරීම සඳහා අපැහැදිලි ගුවන් ඡායාරූප නිකුත් කෙරින. ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල ප්‍රකාශ කලේ සිවිල් වැසියන් මරනයට ගොදුරු වුනි නම් එය එල්ටීටීඊය විසින් ඔවුන් බලහත්කාරයෙන් එහි රඳවා තැබීම නිසා බව ය.

එම ස්ථානයේ සංචාරය කල කතෝලික දේවස්ථානයේ අගරදගුරු රායප්පු ජෝශප් මෙම ඝාතනය හෙලා දැක්කේ ය. ඔහු බීබීසී ගුවන් විදුලි සේවයට පැවසුවේ: "ඒ අවට කිසිදු කොටි කඳවුරක් සොයා ගැනීමට මට නොහැකි විය. එය කුඩා ධීවර ගම්මානයකි. තුවාලවලට සහ මරනයට ගොදුරු වූවන් සිවිල් වැසියන් වෙති" යනුවෙනි. ඔහු ප්‍රහාර පිලිබඳ පැමිනිලි කිරීමට ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂට ලිපියක් ලියා ඇත.

මානව අයිතීන් පිලිබඳ එක්සත් ජාතීන්ගේ නියෝජ්‍ය මහා ලේකම් මාගරිටා වල්ස්ට්‍රම්, අඟහරුවාදා ඝාතන ගැන තම කනස්සල්ල පලකරමින් නිකුත් කල ප්‍රකාශය දෙපාර්ශ්වයට ම සිවිල් පුරවැසියන් ආරක්ෂා කරන ලෙස ආයාචනය කලා ය. ඇය පුවත් පත් නිවේදනයක් නිකුත් කරමින් සඳහන් කලේ, ගුවන් ප්‍රහාරය සිදු වූ අසල පිහිටි ඉලුපායිකඩවායි ගම්මානය යනු, 2006 මුල පටන් ගැටුම්වලින් බේරීම සඳහා 4000 ට වැඩි අතරමං වූ ශ්‍රී ලාංකිකයින් ලැගුම් ගෙන සිටින ස්ථානයක්" යනුවෙනි.

මෙම ප්‍රකාශය දක්වන්නේ 2006 යුද්ධය යලි ආරම්භ වීම මගින් 213,000 ආසන්න ජනතාවක් අවතැන් වී ඇති බවත් ඒ සමග ම 2004 දෙසැම්බර් සිදු වූ සුනාමි ඛේදවාචකය මගින් තක්සේරු ගත 120,000 හා 140,000 අතර සංඛ්‍යාවකට නිවාස අහිමි වී ඇති බවත් ය. මෙය දශක දෙකක් පුරා ඇදී ගිය යුද්ධය මගින් මීට පෙරාතුව අවතැන් වූ 315,000 ජනයාට අමතරව ය.

එ.ජා. සංවිධානය "එදිරිවාදිකම් නවතා දමන" ලෙසත් ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියාවලිය යලි අරඹන ලෙසත් ඉල්ලා ඇත. රාජපක්ෂ ආන්ඩුව ඒ කෙසේ වෙතත් 2002 සටන් විරාම ගිවිසුමට තම ආන්ඩුව බැඳී ඇති බවට හිස් පොරොන්දු දැක්වූව ද එදිරිවාදිකම් අවසන් කිරීමට කිසිදු අභිලාෂයක් ඇත්තේ නැත. 2005 දී තමන් බලයට පැමිනි දා සිට රාජපක්ෂ නොකඩවා එල්ටීටීඊයට එරෙහිව යුද්ධය තීව්‍ර කර ඇත - පලමුව රහස් ඝාතන ද පසුව "මානුෂික" සහ "ආරක්ෂාකාරී" මෙහෙයුම්වල කඩතුරාව යටතේ ඍජු හමුදා ප්‍රහාර පසු ගිය ජුලි මස පටන් ද කරගෙන යති.

අඟහරුවාදා දින මාධ්‍යවලට අදහස් දැක්වීමේ දී හමුදා නායක ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකා ගේ කටින් හමුදා මෙහෙයුම්වල සැබෑ අරමුන එලියට පැන්නේය. බෞද්ධ භික්ෂූන් මුනගැසීම සඳහා මහනුවර කල සංචාරයක දී ඔහු පැවසුවේ: "නැගෙනහිරින් කොටින් මුලින් උපුටා දැමීමෙන් පසු (හමුදාව) උතුර

නිදහස් කර ගැනීමට මුලු (හමුදා) ශක්තිය යොදවනවා" යනුවෙනි. දින කිහිපයකට පෙරාතුව ඔහු කල් තබා ප්‍රකාශ කලේ මසක් ඇතුලත වාකරේ සහ කදිර්වේලි හි නැගෙනහිර ප්‍රදේශ හමුදාව විසින් අල්ලා ගන්නා බවය.

පදහුතුරායි බෝම්බ ප්‍රහාර වනාහි එල්ටීටීඊ පාලන ප්‍රදේශවල සිවිල් ජනතාව ත්‍රස්ත කිරීමේ අරමුනින් දියත් කෙරුනු සාහසිකකම් මාලාවක වත්මන් එක පමනි. එම සිද්ධි එකිනෙකක දී සිවිල් ජනයා වෙතට ප්‍රහාර එල්ල කිරීම දැඩි ලෙස ලංකා හමුදා ප්‍රතික්ෂේප කල අතර, පසුව සාක්ෂ්‍ය ඉස්මතු වනවාත් සමග ඔවුන් (ජනයා) "මානුෂික පලිහක්" ලෙස භාවිතා කෙරෙන්නේ යයි එල්ටීටීඊ ට චෝදනා කලේ ය. ජනාධිපති රාජපක්ෂ පරීක්ෂන මාලාවක් සිදු කරන බවට පොරොන්දු දෙන ලද නමුත් වගකිව යුතු කිසිදු හමුදා නායකයකුට එරෙහිව ක්‍රියාත්මක වී නැත.

හමුදා මෙහෙයුම්වල ප්‍රධාන එල්ලය වන්නේ දිවයිනේ නැගෙනහිර කලාපය යි. සති ගනනාවක් පුරා කාලතුවක්කු, වෙඩි ප්‍රහාර සහ ගුවන් ප්‍රහාර මඩකලපුව දිස්ත්‍රික්කයේ වාකරෙයි ප්‍රදේශයට එල්ල වෙමින් පවතී. පදහුතුරායි බෝම්බ ප්‍රහාර එල්ල කල දින ම, ගුවන් හමුදාව විසින් වාකරෙහි හි බර කාලතුවක්කු ස්ථානයක් විනාශ කර ඇති බව කියා පෑය. බදාදා දින එම ප්‍රදේශයෙහි ම, වෙරුගල් අසල එල්ටීටීඊයේ බර ගිනි අවි ගබඩාවකට තවත් ගුවන් ප්‍රහාරයක් එල්ල කලේය.

හමුදාව විසින් දැනටමත් ජුලි මස සිට නැගෙනහිර ප්‍රධාන ප්‍රදේශ දෙකක් අල්ලාගෙන ඇත. එනම් මාවිල් ආරු සහ ත්‍රිකුනාමලය හි ප්‍රධාන නාවික කඳවුරට දකුනෙන් පිහිටි මූලෝපායිකව වැදගත් සාම්පූර් කලාපය යි. හමුදාවට වාකරෙයි-වෙරුගල් ප්‍රදේශය අල්ලා ගැනීමට හැකි වුවහොත්, එනම් නැගෙනහිර කලාපයේ එල්ටීටීඊයේ - ප්‍රධාන ගොඩ බැසීමේ ස්ථානය - උතුරු දිග වන්නි ප්‍රදේශයේ තම බල කඳවුරුවලින් එල්ටීටීඊයේ නැගෙනහිර සබඳතා බිඳ දැමීමට හමුදාවට හැකි වෙයි. එල්ටීටීඊය නැගෙනහිර බෙදෙනු ද ඇත.

හමුදාව විසින් සාම්පූර් අල්ලා ගැනීමට යෙදූ උපාය ම භාවිතා කරමින් සිටී - එනම්, උපරිම ව්‍යාකුලත්වයක් සහ බේදවාචකයක් ඇති කිරීම සඳහා නොකඩවා පවත්වාගෙන යන, ඉවක් බවක් නැති ගුවන් ප්‍රහාර සහ කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීම. පසු ගිය මාස දෙක පුරා සිදු කෙරුනු මෙවැනි ප්‍රහාරවලින් සිවිල් ජනයා සිය ගනන් ඝාතනය කරනු ලැබ ඇත. 40,000 ක් පමන ප්‍රදේශය අත්හැර පලා ගිය ජනයා තාවකාලිකව අටවන ලද අනාථ කඳවුරුවල බියකරු ලෙස ජීවත් වෙති. හමුදාව විසින් මාර්ග වසනු ලැබ ඇති නිසා තවත් 15,000 ක් පලා යාමට නොහැකිව කොටුවී ඇත.

නැගෙනහිර ආරක්ෂක තත්වය පරීක්ෂා කිරීම සඳහා දෙසැම්බර් 27 දා ත්‍රිකුනාමලයේ නාවික හමුදා කඳවුරක පලමු වතාවට ජාතික ආරක්ෂක කවුන්සිලයේ රැස්වීමක් ජනාධිපති රාජපක්ෂ පැවැත්වූයේය. ඉහල පෙලේ ආරක්ෂක නිලධාරීන් හා ත්‍රිවිධ හමුදාවේ හමුදා නායකයින් සහභාගි වූ මෙම රැස්වීම - හමුදා නායක සරත් පොන්සේකාගේ වචනවලින් කියතොත් - " නැගෙනහිරින් කොටින් මුලින් උපුටා දැමීම" ට ප්‍රහාර ඉදිරියට ගෙනයාම සඳහා ආශිර්වාද ලබා දුන්නේය.

හමුදාව බර යුද අවි, පුපුරන ද්‍රව්‍ය හා උන්ඩ සඳහා විශාල ඇනවුම් ඉදිරිපත් කර ඇත. ජේන්ස් ඩිෆෙන්ස් වීක්ලි වාර්තා කල පරිදි ඉදිරි මාස 18 තුල යුද්ධ ටැංකි, විවිධාකාර බෝම්බ, මිනිසුන් රහිතව පාලනය වන ගුවන් යානා සහ සන්නද්ධ රථ සඳහා ඇ. ඩො. මිලියන 200 ක වියදම් කෙරෙනු ඇත. රාජපක්ෂ ආන්ඩුව මෙම වසරේ ආරක්ෂක වියදම් සියයට 45 කින් වැඩි කලේය.

එල්ටීටීඊය, වඩාත් ආරක්ෂාකාරී පිලිවෙතක් අනුගමනය කරයි. එය මඩකලපුව දිස්ත්‍රික්කයේ තම ස්ථානවලට එල්ල වන පීඩනය අඩු කිරීම සඳහා දරන ප්‍රයත්නයක දී උතුරේ හමුදාව වෙත ප්‍රහාර වැඩි දියුනු කර ඇත. සඳුදා, උතුරු යාපන අර්ධද්වීපයේ වඩමරච්චි ප්‍රදේශයට ප්‍රහාර තුනක් එල්ල කලේය. එල්ටීටීඊ හමුදා ප්‍රකාශක රාසයියා ඉලන්තිරියන් පැවැසුවේ නැගෙනහිරින් හමුදා මෙහෙයුම් අඛන්ඩව සිදු කෙරේ නම් තමන් "අනාගතයේ පූර්ව භංග ක්‍රියාවන් සිදු කරන" බවය.

එල්ටීටීඊයට එරෙහි ප්‍රහාර සමග ආන්ඩුව සහ හමුදාව යුද්ධයට එරෙහි කුමන හෝ විරෝධතාවකට කඩා පනිමින් සිටිති. ද අයිලන්ඩ් පුවත් පත වාර්තා කලේ හමුදා නායක පොන්සේකා මාධ්‍ය කරුවන් සමග සිදු කල සාකච්චාවක දී "ජාතික ආරක්ෂාව අනතුරට හෙලමින් හමුදාවේ යම් අතපසුවීම් ගැන වාසි ගන්නා බවට මාධ්‍යවල කොටසකට චෝදනා එල්ල කලේ" ය. ඔහු "යුද පිටියේ සිදුවන හමුදාවේ පසු බැසීම් ගැන යම් අවස්ථාවල අතිශෝක්තියෙන් වාර්තා කිරීම" ගැන ඔවුන්ට චෝදනා එල්ල කරමින් බල කලේ "එල්ටීටීඊ සමග සටන් කරන විට මාධ්‍යයන් දේශප්‍රේමී විය යුතු ය" යනුවෙනි.

පසු ගිය ඉරිදා ජනාධිපති රාජපක්ෂ යලි යලිත් අනතුරු ඇඟවීය. ජන මාධ්‍යන් විසින් රට "පාවා දීම" හා "ජාතික ආරක්ෂක අවශ්‍යතාවයන් අනතුරට හෙළීම" නොකල යුතු බව ඔහු ප්‍රකාශ කලේ ය. නොවැම්බර් මස ආන්ඩුව පුලුල් පරාසයක වැරදි ක්‍රියා සඳහා නඩු විභාගවලින් තොරව දීර්ඝ කාලීනව රඳවා ගැනීම සඳහා කුරිරු ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතෙහි වඩා විස කවන රූපාකාරයක් නැවතත් හඳුන්වා දුනි. දිවයින

දැනටමත් ජනාධිපති විසින් යටත් කලහැකි පුවත් වාරනයක් සහිත හදිසි නීතිය යටතේ පවතී.

රාජපක්ෂගේ නව වසර පනිවිඩය, "කොටින් මුලිනුපුටාදැමීම" සඳහා කෙරෙන යුද්ධය මගින් හාස්‍යයට ලක් කරයි. "අප බලාපොරොත්තු වන්නේ නව වසර, කාලයක් පෙරුම් පුරා බලා සිටි සත්‍ය හා කල් පවත්වාගත හැකි සාමය ගෙන දෙයි" යනුවෙන් ඔහු පවසන අතර නැගෙනහිර හමුදාව තම මෙහෙයුම් තීව්‍ර කර තිබින. 1990 දශකයේ තම පූර්වගාමියා වූ චන්ද්‍රිකා කුමාරතුංගගේ "සාමය සඳහා යුද්ධය" මෙන්ම මෙම නව ගැටුම්වල මිල දරා ගත යුත්තේ පැහැදිලිව ම සාමාන්‍ය වැඩ කරන මහජනතාවය.

© www.wsws.org